" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "
# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

SLSI ISO 9001 SYSTEM CERTIFIED
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/FIN-BD/02/FI/09-2019(B)
ඔබේ අංකය / உமது இலக்கம் / Your No.
දිනය / திகதி / Date 2020.08.18

අයවැය චක්‍රලේඛ 02/ 2020 (ii)

බස්නාහිර පළාතේ සියලුම ලේකම්වරුන්,

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය/ පාලන/ පිරිස් හා පුහුණු/ සැලසුම්/ ඉංජිනේරු),

දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

## <u>කොවිඩ් - 19 වෛරස ව්‍යාප්තිය නිසා ඇති වී ඇති අහිතකර බලපෑම හේතුවෙන් පළාත් සභා වියදම් පාලනය</u>

කොවිඩ් - 19 වෛරස ව්‍යාප්තිය නිසා ඇති වූ අහිතකර බලපෑම් හේතුවෙන් පළාත් අරමුදලට ලැබිය යුතු ආදායම් අපේක්ෂිත පරිදි නොලැබීමත්, රජය විසින් ජාතිය ගොඩනැගීමේ බදු අහෝසි කළ ද ඒ සඳහා විකල්ප ක්‍රමවේදයක් හඳුන්වා නොදීමත් යන කරුණු මත 2020 මුදල් ප්‍රකාශයෙන් වෙන් කළ ප්‍රතිපාදන ඒ අයුරින්ම වියදම් දැරීම සඳහා මුදල් ලබා දීම ගැටලුකාරී විය. එම නිසා පළාත් සභාවේ සෑම අමාත්‍යාංශයකම, දෙපාර්තමේන්තුවකම වියදම් පාලනයට සීමා පනවමින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත 2020.04.27 දිනැතිව පළාත් අයවැය චක්‍රලේඛ 02/2020 හා 2020.07.06 දිනැතිව අයවැය චක්‍රලේඛ 02/2020 (i) ම'විසින් නිකුත් කරන ලදී.

02. කෙසේ වෙතත් ඇතැම් අවස්ථාවලදී ඉහත චක්‍රලේඛයෙන් පනවන ලද සීමාවන් අනුව කටයුතු කිරීම පිළිබඳ සාධාරණ අපහසුතා දක්වමින් එකී සීමාවන් ඉක්මවා කටයුතු කිරීමට කාර්යාල වෙතින් ඉල්ලීම් ඉදිරිපත් වී ඇත. එම කරුණුද සැලකිල්ලට ගෙන ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත අයවැය චක්‍රලේඛ 02/2020 හි 01 (II) වගන්තිය සහ 01 (V) වගන්තිය පහත පරිදි සංශෝධනය කරමි.

01 (II). අමාත්‍යවරයා සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති ව්‍යාපෘති 01 හි වැය විෂයය අංක 1403 (විදුලිය හා ජලය) හා වැය විෂයය අංක 1404 (බදු කුලී හා පළාත් පාලන ආයතන බදු) සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන හැර අනෙකුත් ප්‍රතිපාදන යටතේ විශේෂ වූ අවශ්‍යතාවයක් මත වියදම් දැරීමට අවශ්‍ය නම් ඒ සඳහා මාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වේ.

01 (V). සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා ආයුර්වේද දෙපාර්තමේන්තුව හැර ප්‍රතිපාදන වෙන් වන අනෙකුත් සියලු ශීර්ෂයන්හි වැටුප්, දීමනා (1001-වැටුප් හා වේතන, 1003-වෙනත් දීමනා, 1503-පළාත් පාලන ආයතන සඳහා වැටුප් ප්‍රතිපූරණ, 1504-ව්‍යවස්ථාපිත ආයතන සඳහා

වැටුප් හා දීමනා) වැය විෂයයන්ගේ හැර අනෙකුත් සෑම පුනරාවර්තන වැය විෂයයකම ඒ ඒ වැය විෂයයෙන් 20% ක ප්‍රතිපාදන ඉතිරි කළ යුතු වේ. කෙසේ වුවද එක් එක් වැය විෂයයෙන් 20% ක ප්‍රතිපාදන ඉතිරි කළ නොහැකි අවස්ථාවල මුළු පුනරාවර්තන ප්‍රතිපාදනවලින් 20% ක් ඉතිරි කිරීම් කළ හැකි වුවද ඒ සඳහා මාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වේ.

ජේ.එම්.සී. ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
පළාත් මුදල් අමාත්‍යාංශ ලේකම් හා
පළාත් භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත් -

01. විගණකාධිපති.
02. ලේකම්, මුදල් කොමිෂන් සභාව.
03. සභාපතිවරු, ව්‍යවස්ථාපිත අධිකාරි - තම අධිකාරිවල මූල්‍ය පාලනය ඇති කිරීම සඳහා
04. අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)